# ශ්‍රී ලංකාවේ තරුණ විරැකියාව හා කුසලතා නොගැලපීම

## හැඳින්වීම

වර්තමානය වනවිට ශ්‍රී ලංකාවේ අවු 13ක අඛණ්ඩ පාසල් අධ්‍යාපනය අනිවාර්ය කර තිබේ.අධ්‍යාපනය අවුරුදු 5 සිට අවුරුදු 13ක් හෝ ප්‍රථම උපාධිය සඳහා සුදුසු කම් ලැබුවහොත් තවත් අවුරුදු තුනක් හෝ හතරක කාලයක් අධ්‍යාපනය ලබයි.මේ සියලු පහසුකම් නිසා ශ්‍රී ලංකාවේ වර්තමානය වනවිට සමස්ථ සාක්ෂරතාවය 92.6%කි.**උසස් පෙළ විභාගයෙන් විශ්ව විද්‍යාලයයට සුදුසු කම් ලබන පිරිස සියයට 63 ඉක්මවා ඇත**. 2015-2016 අධ්‍යයන වර්ෂයට විශ්වවිද්‍යාලයට ඇතුලත්වීමට **සුදුසුකම් ලැබූ පිරිසෙන් 18.6% ක්** විශ්ව විද්‍යාලයට ඇතුලත් වී ඇත.

එය එසේ වුවත් සමහර වාර්තාවන්ට අනුව මුළු ශ්‍රී ලංකාවේම විශ්ව විද්‍යාලවලින් පිටවන උපාධිධාරීන් බහුතරයක් රැකියා වෙළඳපල හි ඉල්ලුම හා සරිලන ශක්‍යතාවයක් නොදක්වයි. එනම් කුසලතා නොගැලපීමක් දක්නට ලැබේ.බොහෝ සේව්‍යයයන් අතර මුල් බැසගෙන ඇති මතයක් වන්නේ **බහුතරයක් උපාධිධාරීන් අතර ආකල්ප හා සන්නිවේදන කුසලතාවයන් හි ඌනතාවයක් පවතින බවය.නිර්මාණශීලීව ගැටළු විසඳීම, සාමූහිකව වැඩ කිරීම, වෙනස් වන තත්වයන්ට අනුගතවීමෙහි දුර්වලතාවයක්** ඔවුන්තුල දක්නට ලැබෙන බව ඔවුන් බහුතරයකගේ මතයයි.එසේම ඉංග්‍රීසි භාෂාවහි සමර්ථකම් දැක්වීමෙහි දුර්වලතාවයක් හා සමාජ ආර්ථික දැනුම පුළුල්ව ඇතත් සමහර මෘදු හා දෘඩ කුසලතාවන් දුර්වල මට්ටමක පවතීයැයි ඔවුන් චෝදනා කරයි.

### තරුණ විරැකියාව

වයස අවුරුදු 15 හා 24 අතර තරුණයින්ගේ රැකියා විරහිත භාවය මෙලෙස හඳුන්වයි. වර්තමානය වන විට 2017 දත්ත අනුව තරුණ විරැකියාව 18.5% ක් වේ. පසුගිය වසර කීපයකට අනුව තරුණ විරැකියාව පහත සටහන අනුව දැක්විය හැක.

| අධ්‍යාපන මට්ටම | වසර | | | | | |
|---|---|---|---|---|---|---|
| | **2012** | **2013** | **2014** | **2015** | **2016** | **2017** |
| **මුළු ගණන** | 17.2 | 19.2 | 20.3 | 20.8 | 21.6 | 18.5 |
| **5 ශ්‍රේණිය හා ඊට අඩු** | 3.8 | 6.9 | 10.4 | 4.8 | 6.5 | 7.8 |
| **6-10 ශ්‍රේණිය දක්වා** | 12.2 | 13.3 | 14.8 | 14.1 | 16.3 | 11.8 |
| **අ.පො.ස(සා.පෙළ)** | 20.5 | 21.9 | 22.8 | 23.9 | 22.4 | 21.1 |
| **අ.පො.ස(උ.පෙළ) හා ඉහල** | **30.6** | **33.5** | **31.3** | **34** | **32.5** | **29.1** |

මූලාශ්‍රය:-ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

අ.පො.ස(උ.පෙළ) හා ඉහල අධ්‍යාපනයක් ලැබූ පිරිස අතර තරුණ විරැකියාව ඉහල අගයක් ගෙන ඇත.

**කුසලතා නොගැලපීම**

අද පවතින තරඟකාරී වැඩ පරිසරයට සුදුසු පරිදි තරුණයන් සූදානම් කල නොහැක්කේ මන්ද යන්න ගැටළුවකි.සාම්ප්‍රදායික උසස් අධ්‍යාපන ආයතනවල වේගයෙන් වෙනස්වන කුසලතා ඉල්ලුමට සරිලන පරිදි විෂය මාලා සැලසුම් වී නොමැත.විශ්ව විද්‍යාලවල පාඨමාලා වෙනස්වන කර්මාන්ත අවශ්‍යතා පාදක කරගෙන නිර්මාණය විය යුතුය. වර්තමානය වනවිට අප ජීවත් වන ලෝකයේ පවතින්නේ මීට වසර 25 කට පෙර තිබූ රැකියා වලින් අඩක්ම වෙනස් වූ අවධියකයි.
අධ්‍යාපනය වයස අවුරුදු 6 සිට 22 දක්වා පවතින්නක් පමණක් නොව වසරින් වසර අප උගත් දේවල් වලට නව දැනුම එකතුවේ.මේ නිසා රැකියා පුහුණුව අඛණ්ඩ ක්‍රියාවලියක් ලෙස පැවතිය යුතුව ඇත.
මෙම තත්වයන්ට සාර්ථකව මුහුණ දීමට අදාල වගකිය යුතු සියළු පාර්ශවයන්ගේ සාමූහික ප්‍රයත්නයක් අවශ්‍ය වේ. ප්‍රධාන වගකීම වන්නේ මිනිස් බල සංවර්ධනයට අඩිතාලමක් දැමීම හා ශ්‍රී ලංකාවේ දැනුම මත පදනම් ආර්ථිකය  ක්‍රියාත්මක විය යුතුය.

උසස් අධ්‍යාපන ආයතනවල පුළුල් කලයුතු වගේම සේව්‍යයන්ගේ පාර්ශවයෙන් සිදුවියයුතු කාර්යයන් ගැන අවධානය යොමු කලයුතුය. මින් එක් පාර්ශවයක් නිෂ්පාදකයන්ය, ශ්‍රම බලකාය උපයෝජනය කිරීම දෙවන පාර්ශවයයි. මේ දෙපාර්ශවයම එකඟතාවයකට පත්වීමෙන් සිදුකලයුතු ක්‍රියාවලියක් මගින් ආර්ථිකයේ සියළු අංශ කෙරෙහි පුද්ගලයන් සැපයීමක් සිදුවිය යුතුය.එවැනි දැක්මක් සහිතව ක්‍රියාත්මක වීමෙන් කුසලතා නොගැලපීම සංතුලනය කලහැක.

කුසලතා නොගැලපීම උගත් තරුණ ප්‍රජාව අතර දැකිය හැකි අංශ පහත දැක්වේ.

**1.මූලික කුසලතා (කියවීම, ලිවීම,සන්නිවේදන හා මානව සබඳතා )**

**2.තාක්ෂනික කුසලතා(යන්ත්‍ර සූත්‍ර,උපකරණ,ඉදිකිරීම්,පරිඝනක ආදිය හැසිරවීම්)**

**3.වෘත්තීය කුසලතා (නීතිය, වෛද්‍ය විද්‍යාව,අලවිකරණය,උගැන්වීම,හෙද සේවය )**

**4.කළමනාකරන හා නායකත්ව කුසලතා(අධීක්ෂණය,කණ්ඩායම් කුසලතා,අරමුණු ගතවීම,සැලසුම් කරණය,අභිප්‍රේරණය,තීරණ ගැනීම,කැපවීම)**

**5.භාවාත්මක නුවණ(ස්වයං දැනුවත් භාවය, ස්වයං විනය,අප්‍රතිහත ධෛර්යය,නොපසුබටව ක්‍රියාත්මක වීම,අන්තර් ඥානය)**

කුසලතා නොගැලපීම නිරාකරණය කිරීම යනු තාක්ෂණය,ඉංජිනේරු කාර්යයන්,විද්‍යාව හා ගණිතය පිළිබඳ දැනුවත් කිරීම පමණක් නොව මෘදු කුසලතාද සංවර්ධනය කිරිමයි.

සුදුසු සමබර කුසලතා රැසකින් සමන්විත වීම සඳහා පුහුණු කිරීම් රජය සෘජු මැදිහත් වීමකින් සිදුවීම අවශ්‍ය කටයුත්තකි. තාක්ෂණ විද්‍යාල, කාර්මික විද්‍යාල,විශ්ව විද්‍යාල සුදුසු අධ්‍යාපන විෂය මාලාවන්

සංවර්ධනය විය යුතුය.සේව්‍යයන් ගේ අවශ්‍යතාවලට සරිලන පරිදි කුසලතාවයන් සංවර්ධනය විය යුතුය.

- **ප්‍රධාන අභියෝගය නම් ශ්‍රී ලංකාවේ අනාගතයට අවශ්‍ය කුසලතා වශයෙන් පුරෝකථනය කිරීමයි. අද ද්විතීය අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන් රටේ අනාගතය හැඩගස්වන්නන් වුවත්, ඔවුන්ගේ අනාගතය ගැන තීරණය කලයුතු තරම් තොරතුරුවලින් සන්නද්ධ කිරීමට අපට තවමත් නොහැකිවී ඇත.**
- **වඩාත්ම ප්‍රමුඛතාවයට පත්විය යුතු දේනම් ශ්‍රී ලංකාවට අවශ්‍ය වර්තමාන කුසලතා හා අනාගතයට අවශ්‍ය වියයුතු කුසලතා පිළිබඳවයි. ඉතා විශ්වාස දායි හා ප්‍රචලිත කර හැකි ශ්‍රමවෙළඳපල තොරතුරු අපට අවශ්‍ය වී තිබේ.**
- **කුමන රැකියාවක් සඳහා කුසලතා අවශ්‍යදැයි යන්න නිසිකලට දැන ගැනීමේ ක්‍රමයකින් අපට ප්‍රයෝජන ලබාගත හැක.මේ වන විට ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය එළිදැක තිබේ. වර්තමාන ශිෂ්‍යයයන් අනාගතයේදි නව ව්‍යාපාර අරඹනු ඇත. ඒ සඳහා ඔවුන් දැනුමෙන් සන්නද්ධ කලයුතුය.**
- **රජය , කර්මාන්ත අංශය හා අධ්‍යාපන ආයතන අතර සම්බන්ධතාවයන් වඩා සමීප කල යුතුය. එවිට කුසලතාවයන් පිළිබඳ ගැටළු නිරාකරණය කරගැනීම වඩා පහසුවනවා ඇත.**


මූලාශ්‍ර:-

*අධ්‍යාපන අමාත්‍යාංශය -වෙබ් අඩවිය

*ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - වෙබ් අඩවිය

*ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව - වෙබ් අඩවිය

*2017 වාර්ෂික ශ්‍රමබල සමීක්ෂණ වාර්තාව,ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව